

# ඇගක්කාර විහඩ්

මිනාරා සමෝධි ඒකනායක

| | |
|---|---|
| කෘතියේ නම | : දඟකාර විහස් |
| කතෘගේ නම | : මිනාරා සමෝධි ඒකනායක |
| කතෘ අයිතිය | : මිනාරා සමෝධි ඒකනායක |
| කතෘගේ වෙනත් කෘති | : මිලී සහ සිතී |
| ISBN අංකය | : 978-624-208-459-6 |

# පිදුම

මෙම පොත ලියන්නට

මා දිරිගැන්වන ලද

මහාමායාවේ ගරු විදුහල්පති තුමිය ඇතුළු

සියළු ගුරු මෑණිවරුන් පියවරුන් වෙත

සෙනෙහසින් පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටෙ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අඤ්දස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීතයතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණ ගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගතදිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


එකමත් එක කාලෙක පුංචි පිරිමි ළමයෙක් සිටියා. ඔහුගේ නම විහස්.
ඔහු ඉතාම දඟකාරයි. ඔහු ඔහුගේ අම්මයි, තාත්තයි, ආච්චියි කියන දේ කන කටවත් ගන්නේ නෑ. අම්මයි තාත්තයි වැඩට ගියාම ඔහුව බලා කියා ගන්නේ ආච්චි.



ඇය ඔහුව නාවනවා, කවනවා, රස
කෑම සාදා දෙනවා. රස රස කතන්දර
කියා දෙනවා. ඒ උනාට ඔහු ඇයගේ
කොණ්ඩේ අදිනවා, විහිළු තහළු
කරනවා. ආච්චිට කරදර කරනවා.
ඔහුගේ මේ ක්‍රියාවලට සීයා
කොහෙත්ම කැමති නෑ.




විහස් එක දවසක් ආච්චිට කිව්වා අල්ලන් සෙල්ලම්
කරමු කියලා. ඒ උනාට ආච්චි බෑ කියලා කිව්වා.
ඒත් හොඳටම කරදර කරා. ඊට පස්සේ ආච්චි සෙල්ලම්
කරන්න ආවා. ආච්චිට මහන්සි නිසා ආයේ ගිහින්
හාන්සි පුටුවේ හාන්සි වුණා. තව සෙල්ලම් කරමු කියලා
ආච්චිට කරදරකළා. සීයා ඇවිත් ඔහුට හොඳටම බැන්නා.
ඔහුට හොඳටම තරහ ගියා.
ඊට පස්සේ ඔහු ගෙදරින් හොරෙන් පැනලා ගියා.




ඔහු පාර දිගේ යන විට
හා පැටියෙක් දුටුවා.
ඔහු හා පැටියා පසුපස ලුහුබැන්දා.
පසුව බලන විට ඔහු ඇතුළු
වී සිටියේ වනාන්තරයකට.




ආච්චි හාන්සි පුටුවෙන් නැගිට කිරි
වීදුරුවකුයි බිස්කටුයි  විහස්ට ගෙන
ගියා.  එවිට ඔහු   ඔහුගේ කාමරේ
සිටියේ නැහැ.  ඇය හොදටම කලබල
වුනා.  සීයා පත්තරයක් බල බලා
සිටියේ ආච්චි හනික ඇවිත් සීයාට මේ
බව  පැවසුවා, ඔවුන් දෙන්නා
ගොඩක් බය වුනා.




දගකාර විහස් නොදැණුවත්වම
වනාන්තරේ මධ්‍යයට පැමිණ සිටියා.
ඔහු විෂඝෝර සර්පයෙක් දුටුවා, ඔහු
මහත් සේ බය වී වනාන්තරයේ
ඇතුලටම  ගියා.
ඔහු ගලක් උඩ වාඩිවී බියවී ඇඬුවා




ආච්චි සීයයි මේ බව අම්මටයි තාත්තටයි
පවසා සිටියා. අම්මයි තාත්තයි ගෙදර
එනවිට විමසිලිමත්ව පැමිණියා. එතකොට
ළමයෙක්ගේ අඩි සළකුණක් කැලෑව
දෙසට තිබෙනු දුටුවා. අම්මයි තාත්තයි
ගෙදර පැමිණ සිදුවූ සියල්ල දැනගෙන
තාත්තා සීයත් සමග වනාන්තරයට යාමට
අවශ්‍ය දෑ රැගෙන පිටත් වුනා.



ආච්චිත් අම්මාත් පාර දෙපස විපරම් කරමින් නගරය දෙසට ගමන් කරා. ඉන්පසු විහස්ගේ පුංචිත් හමුවුනා. විහස්ගේ පුංචිටත් මේ බව පවසා සිටියා. ඉන්පසු විහස්ගේ පුංචි ඉතාමත් කණගාටු වී විහස්ව සොයන්න එකතු වුනා.



කැළැව දෙසට ගිය තාත්තාට සහ සීයාට විහස් අඬන හඬ ඇසුනා. එදෙසට වහා ගිය තාත්තාට විහස් ගොඩක් බය වී සිටිනු පෙනුනා. එවිටම ඔවුන් දුටුවේ කොටියෙකු විහස්ගේ දෙසට එන බවයි. ඉන් පසු තාත්තා රැගෙන ආ මස් උපයෝගී කරගෙන කොටියාව වෙනත් දෙසකට හරවා හැරියා. ඉන්පසු විහස් ළඟට ගොස් විහස්ව රැගෙන ඉක්මණින් ගෙදරට පිටත් වුනා.



අම්මාට මේ බව දැණුම් දුන් පසු ඔවුන් ගෙදර පැමිණියා. විහස් හොඳටම බයවී හඩමින් කියා සිටියේ නැවත මෙවැනි හිතුවක්කාර වැඩ නොකරන බවයි. ඉන්පසු ආච්චි විහස් කැමතිම කෑම සකසා විහස්ට දුන්නා. ආච්චිට වැද සමාව ගත් විහස් ඉතා තදින් ආච්චිව වැළඳ ගත්තා. ආච්චිද විහස්ගේ ඔළුව අතගා ආදරෙන් විහස්ව වැළඳ ගත්තා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්